## අධ්‍යාපනය

වසර 2000 සිට අ .පො. ස (උ.පෙ.) විභාගය සමග පැවැත්වෙන සාමාන්‍ය පොදු පරීක්ෂණය

**1.0 සාමාන්‍ය පොදු පරීක්ෂණය හඳුන්වාදීමේ හේතු**

විභාග සාමර්ථ්‍යතාව සම්බන්ධයෙන් කෙරෙන අවධාරණය නිසා ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්‍රමය අඛණ්ඩ ව විවේචනයට පාත්‍ර වී තිබේ. ප්‍රසිද්ධ විභාගවල දී විශිෂ්ට ප්‍රතිඵල ලබා ගැනීම හේතුකොට ගෙන ජනප්‍රිය පාසල්වලට හා විශ්ව විද්‍යාලවලට ඇතුළත් වීම, ශිෂ්‍යත්ව දිනාගැනීම හා වාසි සහගත රැකියාවලට ප්‍රවිෂ්ට වීම වැනි විශේෂ අවස්ථා සිසුනට උද වේ. මේ තත්ත්වය නිසා අධ්‍යාපනයේ වඩා වැදගත් අරමුණු අමතක කරමින් සිසුන් විභාග සඳහා සූදානම් කරවීම සම්බන්ධයෙන් ගුරුවරුන් හා දෙමාපියන් තුළ පෙළඹවීමක් ඇති වී තිබේ. ශ්‍රී ලංකාවේ පවත්නා විභාග ක්‍රමය සිසුන් තුළ ඇති තොරතුරු ආවර්ජනය කිරීමේ හැකියාව කෙරේ මහත් විශ්වාසයක් තබා ඇති බව පෙනේ. ඒ අනුව පංති කාමරයේ ඉගැන්වෙන විෂය කරුණු වනපොත් කිරීම විභාගවල දී හොඳ ප්‍රතිඵල අත්පත් කරගැනීමේ ඉතා ම සතුටුදායක ක්‍රමයක් බව සනාථ වී තිබේ. මේ නිසා ශ්‍රී ලංකාව තුළ පරීක්ෂණ හා ඉගැන්වීම් ක්‍රමෝපායන් පිළිබඳ සංකල්ප සමුදයේ වෙනසක අවශ්‍යතාවක් පවතී. විෂය කරුණු වනපොත් කිරීම සම්බන්ධයෙන් කෙරෙන මේ අවධාරණය හේතු කොටගෙන අනාගතයේ කාර්යක්ෂම හා ඵලදායී පුරවැසියන් ලෙස කටයුතු කිරීමට අවශ්‍ය වන උසස් ප්‍රජානන හැකියා හා චින්තන දක්ෂතා වර්ධනය කිරීම ප්‍රබල ලෙස අමතක කෙරෙන බව අධ්‍යාපනඥයින් විසින් නිරන්තර ව පෙන්වා දී ඇත. මේ තත්ත්වය වෙනස් කිරීම සඳහා විවිධාකාරයේ මැදිහත්වීම්වල අවශ්‍යතාවක් පවතී. අ. පො. ස. (උ. පෙ.) විභාගය සමග සාමාන්‍ය පොදු පරීක්ෂණය හඳුන්වා දීම එවැනි මැදිහත් වීමකි. මෙවැනි පරීක්ෂණයක් තුළ අනාගතයේ දී සැබෑ ජීවිත අවස්ථාවලට සාර්ථක ලෙස මුහුණ දීමට ඉවහල් වන තමා ජීවත් වන වටා පිටාව පිළිබඳ සාමාන්‍ය දැනුවත්බව (සම්ප්‍රජානනය) ද සමහර මානසික දක්ෂතා ද ශිෂ්‍යයා තුළ ප්‍රගුණ කිරීමේ අවශ්‍යතාව ඉස්මතු කොට දැක්වීමේ හැකියාව පවතී.

> **මේ ගැන ඔබේ අදහස් අපට ලියන්න**
>
> **වර්ෂ 2000 සිට අ. පො. ස. (උ. පෙ.) විභාගයට පෙනී සිට සරසවි ප්‍රවේශය අපේක්ෂා කරන සියලුම සිසුන් සාමාන්‍ය දැනුවත් බව (General Awareness) හා චින්තන හැකියාවන් පරීක්ෂා කිරීම සඳහා සැලසුම් කෙරෙන සාමාන්‍ය පොදු පරීක්ෂණය යන නමින් හැඳින්වෙන ප්‍රශ්න පත්‍රයකට පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය පැවැත්වෙන්නේ අනෙක් විෂයයන් තුනට අමතර වශයෙනි. බහුවරණ ප්‍රශ්න 60 කින් සමන්විත මේ ප්‍රශ්න පත්‍රයේ ආකෘතියක් මේ සමඟ පළවේ. 2000 දී පැවැත්වෙන පරීක්ෂණයේ ස්වභාවය හඳුනා ගැනීමට ඔබට මේ ආකෘතිය ආධාර වනු ඇත.**
>
> **1998 අප්‍රියෙල් 30වැනිදා දිවයිනේ මධ්‍යස්ථාන 80 ක පාසල් සිසුන් 2469 යොදාගෙන පවත්වන ලද නියාමක පරීක්ෂණයකින් ලබා ගන්නා ලද අත්දැකීම් අනුව සාමාන්‍ය පොදු පරීක්ෂණයේ කාල සීමාව පැය 2 1/2 ක් විය යුතු බව තීරණය කොට තිබේ.**
>
> **මේ යෝජිත පරීක්ෂණය පිළිබඳ පාඨක ඔබ දරන අදහස් ඉදිරි නවයුගය කලාපවල පළකිරීම සඳහා අප වෙත එවන්න.**
>
> ***අපේ ලිපිනය -***
> ***"නවයුගය"***
> ***ලේක්හවුස්***
> ***ඩී. ආර්. විජේවර්ධන මාවත***
> ***කොළඹ 10.***

# 2000දී සරසවි පිවිසුමට එක්වන අභියෝගය

සාමාන්‍ය දැනුවත්බව ( සම්ප්‍රජානනය)
- ප්‍රශ්න 15

ගැටලු විසඳීමේ හැකියාව
- ප්‍රශ්න 15

තර්කණ හැකියාව
- ප්‍රශ්න 15

අවබෝධය හා සන්නිවේදන හැකියාව
- ප්‍රශ්න 15

මෙම ඇමුණුමෙහි සාමාන්‍ය පොදු පරීක්ෂණයට ඇතුළත් කෙරෙන ප්‍රශ්න වර්ග පිළිබඳ නිදසුන් අඩංගු වෙයි. පරීක්ෂණය පිළිබඳ වැඩිදුර විස්තර 1998 වර්ෂය අවසාන වීමට පෙර පාසල්වලට සපයනු ලැබේ.

**2.0 සාමාන්‍ය පොදු පරීක්ෂණයේ ව්‍යුහය**

මෙම පරීක්ෂණය පහත දැක්වෙන සතර විධ බුද්ධිමය ලක්ෂණ පරීක්ෂා කිරීම සඳහා සැකසෙයි.

2.1 සාමාන්‍ය දැනුවත්බව (සම්ප්‍රජානනය)
2.2 ගැටලු විසඳීමේ හැකියාව
2.3 තර්කණ හැකියාව (විශ්ලේෂණාත්මක, විධිමත්, සංඛ්‍යාමය හා අවකාශමය)
2.4 අවබෝධය හා සන්නිවේදන හැකියාව

1998 අප්‍රියෙල් 30 දින දිවයිනේ මධ්‍යස්ථාන 80 ක ජාතික පාසල්වල සහ IAB හා IC පාසල්වල සිංහල හා දෙමළ මාධ්‍යයෙන් කලා , වාණිජ හා විද්‍යා විෂය ධාරාවල ඉගෙනුම ලබන සිසුන් 2469 ක් යොදාගෙන පවත්වන ලද නියාමක පරීක්ෂණයකින් ලබා ගන්නා ලද අත්දැකීම් අනුව සාමාන්‍ය පොදු පරීක්ෂණයේ කාල සීමාව පැය 2 1/2 ක් විය යුතු බව තීරණය කොට තිබේ. පරීක්ෂණය වරණ 5 කින් යුත් වාස්තවික ගණයේ බහුවරණ ප්‍රශ්න 60 කින් සමන්විත වනු ඇත. සාමාන්‍ය පොදු පරීක්ෂණයේ යථෝක්ත කොටස් සඳහා තැබෙන බර පහත දැක්වෙන අන්දමට සිදු වේ.

**2.1 සාමාන්‍ය දැනුවත් බව (සම්ප්‍රජානනය)**

සාමාන්‍ය දැනුවත්බව යනුවෙන් මෙහි දී අදහස් කෙරෙනුයේ බහුල ව පැවැත්වෙන දැනුම මිනුම තරඟවල පිරික්සුමට හසු කෙරෙන අන්දමේ සාමාන්‍ය දැනීම නොවේ. එය ජාතික හා ජාත්‍යන්තර වශයෙන් වැදගත් සංකල්ප හා තොරතුරු පිළිබඳ විචක්ෂණශීලී දැනුවත්බව (සම්ප්‍රජානනය) වේ. මෙම ප්‍රශ්න මගින් පරීක්ෂණයට පෙර අවුරුදු දෙකක කාලය තුළ ආර්ථික සමාජීය, සංස්කෘතික, පාරිසරික, දේශපාලනික, විද්‍යාත්මක හා තාක්ෂණික ක්ෂේත්‍රවල , සිදුවීම්වලට අදාළ සංකල්ප හා තොරතුරු පිළිබඳ දැනුවත්බව පරීක්ෂා කෙරෙයි.

**නිදසුන්**

2. 11 වායුගෝලය තුළ සිදු වන පහත දැක්වෙන ඒවා අතරින් කවරක් පෘථිවියේ උෂ්ණත්වය ඉහළ යාම කෙරේ වඩාත් බලපාන්නේ ද?

1. ඕසෝන් වැඩි වීම
2. ඔක්සිජන් අඩුවීම
3. කාබන්ඩයොක්සයිඩ් වැඩි වීම *
4. දූවිලි අංශු වැඩි වීම
5. න්‍යෂ්ටික පිපිරවීම් වැඩි වීම

2\. 12 මූලික මිනිස් අයිතිවාසිකම් උල්ලංඝණය කිරීම පිළිබඳ පෙත්සම් ඉදිරිපත් කළ යුත්තේ කොතැනට ද?

1. මහේස්ත්‍රාත් අධිකරණයට
2. දිස්ත්‍රික් අධිකරණයට
3. අභියාචනා අධිකරණයට
4. ශ්‍රේෂ්ඨාධිකරණයට *
5. ඔම්බුඩ්ස්මන් හෙවත් දුක්ගන්නාරාලගේ කාර්යාලයට

2\. 13 ජගත්කරණය යනුවෙන් අදහස් වෙන්නේ කුමක් ද?

1. ලෝකය පුරා සිදු වන කාර්මිකරණයේ වර්ධනයයි.
2. ලෝකය පුරා ඩොලරයේ භාවිතය වැඩි වීමයි.
3. ලෝකය පුරා ආර්ථික, වාණිජ හා සංස්කෘතික වශයෙන් සිදු වන අන්‍යෝන්‍ය රැඳියාවේ වර්ධනයයි. *
4. බහුජාතික සමාගම්වලට ලෝකය පුරා කටයුතු කිරීමට ලැබෙන නිදහසයි.
5. දේශගුණික වෙනස්කම් නිසා ලෝකයේ භෞතික හැඩය සම්බන්ධයෙන් ක්‍රමානුකූල ව සිදු වන වෙනස්වීමයි.

2\. 14 දකුණු ආසියාතික කලාපීය සහයෝගිතාව සඳහා සැදුම් ලත් සංගමයේ හෙවත් සාක් සංගමයේ සාමාජිකයකු නොවන්නේ මින් කුමන රට ද?

1. ඉන්දියාව  2. පකිස්තානය
3. තායිලන්තය *  4. නේපාලය
5. මාලදිවයින

2\. 15 හේබියාස් කෝපුස් නමැති නෛතික විධි විධානය අදාළ වන්නේ මින් කුමකට ද?

1. පොලිස් අත් අඩංගුවේ සිටින කෙනකුට *
2. ඉඩම් ආරවුලකට
3. දික්කසාද වීමකට
4. සිවිල් වන්දි නඩුවකට
5. රිය අනතුරකට

- ගැටලුවක් විසඳීම සඳහා උදව් වන සාදෘශ්‍යයන් හෙවත් සමාන තොරතුරු , සමාන අවස්ථා හඳුනා ගැනීම
- කිසියම් තොරතුරු කිපයක්, නැතහොත් සමූහයක් යම්කිසි ආකාරයකට සංයෝජනය කරමින් අවස්ථාවක් ප්‍රතිව්‍යුහගත කිරීම

නිදසුන්

2\. 21 විශ්ව කෝෂය, ශබ්ද කෝෂය, සිතියම් පොත, දින දර්ශනය යනාදියට පොදු වූ ලක්ෂණයක් ඇත. පහත ඒවා අතුරින් එම ලක්ෂණ ඇත්තේ කවරක ද?

1. කෙටිකතා සංග්‍රහය
2. ප්‍රවෘත්ති පත්‍රය
3. සඟරාව
4. චිත්‍රකතා පොත
5. දුරකථන නාමාවලිය "

2\. 22 බැඩ්මින්ටන්, මේස පන්දු, වෙස් සහ කැරම් යන ක්‍රීඩාවලට පොදු වූ කිසියම් ලක්ෂණයක් ඇත. පහත සඳහන් ක්‍රීඩා අතුරින් එම ලක්ෂණ ඇති ක්‍රීඩාව කුමක් ද?

1. ක්‍රිකට්
2. හොකී
3. අත්පන්දු
4. බොක්සිං *
5. දැල්පන්දු

- 2\. 23 හා 2. 24 අංක දරන ප්‍රශ්න පදනම් වන්නේ පහත දැක්වෙන රූප සටහන මත ය. මේ රූප සටහනේ දැක්වෙන චතුරස්‍ර යොදා ඇත්තේ කිසියම් සංඛ්‍යාමය රටාවකට අනුව ය. එම රටාව අධ්‍යයනය කොට A හා B යන හිස් තැන්වලට අදාළ නිවැරදි කොටස් දී ඇති කොටස් අතරින් තෝරන්න.

1 රූපය



1 රූපය

2\. 16 පහත දැක්වෙන ස්ථාන සංයෝජන අතරින් කවරක් නම් සංස්කෘතික ත්‍රිකෝණය දක්වයි ද?

1. මහනුවර, අනුරාධපුරය සහ දඹුල්ල
2. අනුරාධපුරය, පොළොන්නරුව සහ සීගිරිය *
3. පොළොන්නරුව, සීගිරිය හා දඹුල්ල
4. පොළොන්නරුව, සීගිරිය සහ මහනුවර
5. අනුරාධපුරය, පොළොන්නරුව හා මහනුවර

2\. 17 ඉන්ටර්නෙට් (අන්තර්ජාලය) යනු කුමක් ද?

1. ධනවත් රටවල් අතර තොරතුරු බෙදා ගන්නා පද්ධතියකි.
2. ජගත් තොරතුරු ජාලයකි. *
3. ලෝකයේ විශ්ව විද්‍යාල අතර තොරතුරු බෙදා ගන්නා පද්ධතියකි.
4. බහු ජාතික සමාගම්වලට පමණක් භාවිත කළ හැකි තොරතුරු ජාලයකි.
5. යුද්ධමය රහස් තොරතුරු ඒකරාශි කර ගැනීමට යොදා ගන්නා ජාලයකි.

2\. 23 A නැමති හිස් තැනට සුදුසු රූපය තෝරන්න



2 රූපය

2\. 24 B නැමති හිස් තැනට සුදුසු රූපය තෝරන්න



3 රූපය

2.2 ගැටලු විසඳීම

ගැටලු විසඳීම පහත දැක්වෙන ත්‍රිවිධාකාර හැකියා මත පදනම් වෙයි.

- ගැටලුවක් විසඳීම සඳහා අවශ්‍ය වන කිසියම් තොරතුරක්, තොරතුරු කිපයක් හඳුනා ගැනීම

- අංක 2. 25 හා 2. 26 යන ප්‍රශ්නවල ගැටලුවක් සමග අංක 1 හා අංක 2 වශයෙන් වගන්ති දෙකක් දී තිබේ.
- ගැටලුව විසඳීමට 1 වගන්තිය පමණක් ප්‍රමාණවත් වේ නම් A ද
- ගැටලුව විසඳීමට 2 වගන්තිය පමණක් ප්‍රමාණවත් වේ නම් B ද

- ගැටලුව විසඳීමට 1 හා 2 යන වගන්ති දෙක වෙන වෙන ම යොදා ගත හැකි නම් C ද
- ගැටලුව විසඳීමට 1 හා 2 යන වගන්ති දෙක එකට යොදා ගත යුතු නම් D ද
- ගැටලුව විසඳීමට 1 හා 2 යන වගන්ති දෙකෙන් ම පිටිවහලක් නොලැබේ නම් E ද තෝරන්න.

2. 25 සාමාන්‍ය පොදු පරීක්ෂණයෙන් පිරාන් ලත් ලකුණු කවරේ ද?
1. පිරාන්, රමේෂ් හා මෙවන් පරීක්ෂණයෙන් ලත් ලකුණු සමාන නොවේ.
2. රමේෂ්, මෙවන් හා පසන්ගේ ලකුණුවල එකතුව 150 ක් වන අතර පිරාන් ලබා ගත් ලකුණු රමේෂ් හා මෙවන් ලබා ගත් ලකුණුවල එකතුවට සමාන ය.

1. A 2. B 3. C 4. D 5. E *

2. 26 ප්‍රථම වරට සාමාන්‍ය පොදු පරීක්ෂණය පවත්වනු ලබන්නේ කවදා විය හැකි ද?
1. වර්ෂ 2000 අගෝස්තු මස 20 වෙනි ද හා 22 ද යන දින දෙක අතර දිනයක මෙම පරීක්ෂණය පැවැත්වේ. 21 වෙනිද ඉරිද දවසකි.

2. පරීක්ෂණය ඉරිදා දවස්වල නොපැවැත්වේ.

1. A 2. B 3. C 4. D * 5. E

**2.3 තර්කන හැකියාව**

තර්කන හැකියාව සතර විධ ආකාරයකින් පරීක්ෂා කෙරේ.

**2. 3. 1. විශ්ලේෂණාත්මක තර්කණය**

පුද්ගලයින්, ස්ථාන, ද්‍රව්‍ය හා සිදුවීම් අතර සම්බන්ධතාව විස්තර කැරෙන වගන්තිවල, නීතිවල හා තත්ත්වවල අඩංගු යම් යම් තොරතුරු හා ඉඟි තේරුම් ගැනීමේ හැකියාව විශ්ලේෂණාත්මක තර්කණ හැකියාව ලෙස හැඳින්විය හැකි ය. මෙහිදී පරීක්ෂාවට භාජනය කෙරෙනුයේ තොරතුරු කිහිපයක් පදනම් කරගෙන තීරණයකට එළඹීමේ (නිගාමී චින්තන) හැකියාවයි.

නිදසුන්

- ප්‍රශ්න අංක 2. 311 සහ 2. 312 යන ප්‍රශ්න පදනම් වන්නේ පහත සඳහන් විස්තර මතය. මෙහි දක්වා ඇත්තේ එක්තරා කාර්යාලයක සේවය කරන නිලධාරීන්ගේ වැඩ කිරීමේ චර්යා රටාවය.
- a, b, c, d, e, f, g සහ h මෙම කාර්යාලයේ සිටින නිලධාරීහු වෙති.
- a, c, e, f, සහ h ජ්‍යෙෂ්ඨ නිලධාරීහු වෙති
- a, d, f සහ h උදේ වරුවේ සේවය කිරීමට කැමති අතර ඉතිරි අය උදේ සහ රෑ සේවා මුර දෙකෙහි ම සේවය කිරීමට කැමති ය.
- a සහ d සමඟ එකට සේවය කිරීමට ද c, g සමඟ එකට සේවය කිරීමට ද අකමැතිය.
- a සහ f සඳුදා දිනවල නිවාඩු ගනියි.
- a සහ c අඟහරුවාදා දිනවල නිවාඩු ගනියි.
- c සහ e බදාදා දිනවල නිවාඩු ගනියි.
- e සහ g බ්‍රහස්පතින්දා දිනවල නිවාඩු ගනියි.
- g සහ h සිකුරාදා දිනවල නිවාඩු ගනියි.
- b, d සහ h සෙනසුරාදා දිනවල නිවාඩු ගනියි
- b, d සහ f ඉරිදා දිනවල නිවාඩු ගනියි.
- b, d සහ f ඉරිදා දිනවල නිවාඩු ගනියි.

2. 311 සෙනසුරාදා උදේ සේවා මුරයේ g නැමති කනිෂ්ඨ නිලධාරියා සමඟ සේවයේ යෙදවිය හැකි ජ්‍යෙෂ්ඨ නිලධාරීහු කවරහු ද?

1. a, c, f 2. a, e, f, h 3. a, e, f * 4. a, c, e, f 5. a, c

2. 312 සෙනසුරාදා රෑ සේවා මුරයේ එකට සේවයේ යෙදවිය හැක්කේ කුමන ජ්‍යෙෂ්ඨ හා කනිෂ්ඨ නිලධාරීහු ද?

1. a, b 2. f, g 3. c, g 4. e, g * 5. b, e

**2 3. 2 විධිමත් තර්කණය**

විධිමත් තර්කණය යටතේ පහත දැක්වෙන හැකියා පරීක්ෂාවට භාජනය කෙරෙයි.

- සාවද්‍ය තර්ක හඳුනා ගැනීම
- උපකල්පන හඳුනා ගැනීම
- සාධාරණ නිගමනවලට එළඹීම
- ප්‍රකාශ, අදහස් විවේචනාත්මක ව ඇගයීම
- කිසියම් තර්කයක් පිළිබඳ ලැබෙන අමතර තොරතුරුවල බලපෑම් ඇගයීම
- සාධාරණ සාමාන්‍යකරණවල (අනුමිතිවල) යෙදීම

නිදසුන්

2. 321 රුධිරයේ අඩංගු කොලෙස්ටරෝල් මට්ටම හෘදයාබාධවලට ප්‍රබල හේතු කාරකයකි.
කොලෙස්ටරෝල් මේද වර්ගයකි. සමබර ආහාර වේලකට මේදය අවශ්‍ය ය. සතියකට බිත්තර දෙකක් ගැනීමට සමහර වෛද්‍යවරුන් නිර්දේශ කරන්නේ බිත්තරවල අඩංගු ප්‍රෝටීන් පරිපූර්ණ ප්‍රෝටීන් වර්ගයක් වන බැවිනි. බිත්තරවල සුදු කොටසේ කොලෙස්ටරෝල් නැත.
යථෝක්ත තොරතුරුවලට අනුව එළඹිය හැකි සහේතුක නිගමනය කුමක් ද?

1. හෘදයාබාධවලට හේතුව කොලෙස්ටරෝල් ය.
2. බිත්තරවල කොලෙස්ටරෝල් බොහෝ සෙයින් ඇත.
3. ආහාරයෙන් මේදය සම්පූර්ණයෙන් ඉවත් නොකළ යුතු ය. *
4. සතියකට දෙවරකට වඩා බිත්තරවල සුදු කොටස අනුභව කිරීම අනතුරුදායක ය.
5. සියලු ම මේද වර්ග කොලෙස්ටරෝල් ය.

2. 322 අපගේ සමීක්ෂණයේ දී ප්‍රශ්න කළ අයගෙන් 47% A සබන් වර්ගය පාවිච්චි කරන බවත් , 53% B සබන් වර්ගය පාවිච්චි කරන බවත් පැවසුවේ යැයි පද්මිණී කීවාය.
එසේ නම් ප්‍රශ්න කළ සියලු දෙනා ම කිසියම් සබන් වර්ගයකට කැමති බව පෙනවා නේ දැයි අනුර විමසී ය.
නැහැයි පිළිතුරු දුන් පද්මිණී 27% ක් එක ද සබන් වර්ගයකටවත් කැමැති නැතැයි ප්‍රකාශ කර තිබෙන බව පැවසුවාය .
මේ තොරතුරු අනුව බැස ගත හැකි නිවැරදි නිගමනය මින් කුමක් ද?

1. එකද සබන් වර්ගයකට වත් කැමැති නැතැයි ප්‍රකාශ කර ඇති සමහරුන් කියා ඇත්තේ බොරුවකි.
2. A සබන් වර්ගය පාවිච්චි කරන බව කී සමහරු B සබන් වර්ගය ද පාවිච්චි කරති.
3. එකද සබන් වර්ගයකටවත් කැමැති නැතැයි ප්‍රකාශ කළ අය මේ සබන් වර්ග දෙකින් කුමක් හෝ පාවිච්චි කරති. *
4. ප්‍රශ්න කළ අයගෙන් කවුරුවත් රූප ලාවණ්‍යය වැඩි දියුණු කරන සබන් පාවිච්චි කිරීමට රුචිකමක් නොදක්වති.
5. A හා B යන සබන් වර්ග දෙක ම නම් දෙකකින් නිපදවෙන එක ම සබන් වර්ගයෙකි.

**2 3. 3 සංඛ්‍යාමය තර්කණය**

සංඛ්‍යාමය තර්කණ හැකියාව පිළිබඳ ගැටලු අංක ගණිතයට හා සරල ගණිතයට අදාළ ඉලක්කම් භාවිත හැකියාව හා සම්බන්ධ ය.

නිදසුන්

2. 331 ශිෂ්‍යයන් 100 කින් සමන්විත පංතියක, සෑම ශිෂ්‍යයකු ම හඳුනා ගැනීම සඳහා අංක 001 සිට 100 දක්වා නිකුත් කිරීමට පංතිය භාර ගුරුවරයාට අවශ්‍ය වී ඇත. එහෙත් කිසි ම ශිෂ්‍යයෙක්, ශිෂ්‍ය අංකයේ ඉලක්කම් එකතු වීමෙන් සෑදෙන ගණන 13 නම් එම අංකය භාර ගැනීමට කැමති නොවේ. එවැනි ශිෂ්‍ය අංකය ලැබිය හැකි ශිෂ්‍යයන්ගේ සංඛ්‍යාව කොපමණ ද?

1. 12 2. 10 3. 08 4. 06 * 5. 04

2\. 332 කුලී රථ රියදුරෙක් 4Km දක්වා දුරක් ගමන් කිරීමට රු. 50/- ක් ද, ඉන් පසු ව ගමන් කරන සෑම කිලෝමීටරයකට ම හෝ ඊට අඩු දුරකට රු. 10/- ක් ද අය කරයි. ඔබ 8.5Km ක දුරක් මෙම කුලී රථයෙන් ගමන් කළේ නම්, ඔබට ඒ සඳහා වැය යන මුදල කොපමණ ද?
1\. රු. 110 2. රු. 100 * 3. රු. 95 4. රු. 90 5. රු. 85

**2\. 3. 4 අවකාශගමය තර්කණය**

අවකාශ තර්කණ හැකියාව යනුවෙන් අදහස් වන්නේ කෙනෙකු තුළ තිබෙන අනාගත අවස්ථා, තත්ත්ව, ප්‍රතිවිපාක පරිකල්පනය කිරීමේ හා දැකීමේ හැකියාවයි. අනාගත තත්ත්වවලට හා අවස්ථාවලට ගැළපෙන සේ නිගමනවලට එළඹීමට කෙනෙකු තුළ ඇති හැකියාව ද මෙයින් අදහස් කෙරේ.

2\. 341 පහත දැක්වෙන වෘත්තාකාර සිතියම පාට කළ යුතු ව ඇත්තේ යාබද ප්‍රදේශ දෙකක් එක ම පාටකින් යුක්ත නොවන පරිද්දෙනි. ඒ සඳහා රතු , නිල්, කොළ සහ කහ යන පාට පමණක් යොදගත යුතු වේ. සිතියමේ යමහර පෙදෙස් එහි දැක්වා ඇති ආකාරයට පාට කර අවසාන ය. කේන්ද්‍රයේ පිහිටා ඇති වෘත්තාකාර පෙදෙස, පහත සඳහන් පාටවලින් කුමන පාටකින් යුක්ත විය හැකිද?




**4 රූපය**

1\. කොළ, නමුත් රතු හෝ නිල් නොවේ. *
2\. නිල්, නමුත් කොළ හෝ රතු නොවේ.
3\. රතු, නමුත් නිල් හෝ කහ නොවේ.
4\. රතු හෝ නිල්, නමුත් කොළ නොවේ.
5\. කහ, රතු හෝ නිල් වේ.

2\. 342 පහත සඳහන් රූපයේ ත්‍රිකෝණ කීයක් දක්නට ලැබේ ද?



**5 රූපය**

1\. 07 2. 09 3. 14 4. 15 5. 16 *

- 2\. 343 හා 2. 344 අංක දරන ප්‍රශ්නවල මුල් රූපයෙහි දිග අරින ලද පෙට්ටියක් පෙන්නුම් කරයි. එහි පැතිවල මුහුණත්වල යම් ලකුණු කීපයක් ද යොද තිබේ. මේ මුල් රූපය පෙට්ටියක් වන සේ නැවූ විට මින් එක ආකාරයකට ඒ පෙට්ටිය නැබිය නොහැකි ය. එසේ පෙට්ටිය නැබිය නොහැකි ආකාරය මින් කුමක් ද?

2\. 343 1 2 * 3 4 5

**6 රූපය බලන්න**

2\. 344 1 2 3 * 4 5



**7 රූපය**

**2\. 4 අවබෝධය හා සන්නිවේදන හැකියාව**

අවබෝධය හා සන්නිවේදන හැකියාව උපහැකියා රැසක් ආවරණය කරන අතර ඒ පිළිබඳ ප්‍රශ්න මගින් එම උපහැකියා එකක් හෝ කීපයක් පරීක්ෂාවට ලක් කරනු ඇත. ඒ උපහැකියා මෙසේ ය.

- ඡේදයක ප්‍රධාන අදහස් හඳුනා ගැනීම
- කිසියම් ප්‍රකාශනයක යටින් දිවෙන අදහස් තේරුම් ගැනීම
- ප්‍රකාශනයක අදහස් අතර ඇති සම්බන්ධතා හඳුනා ගැනීම
- කිසියම් ප්‍රකාශයක ප්‍රතිවිපාක හඳුනා ගැනීම
- කරුණු හා මතවාද අතර වෙනස තේරුම් ගැනීම
- උපදෙස් පිළිපැදීම
- ප්‍රස්තාර මගින් ඉදිරිපත් කෙරෙන දත්ත අවබෝධ කර ගැනීම
- පණිවුඩ කේතකරණය හා විකේතකරණය
- සිතිවිලි, අදහස් අර්ථවත් අනුපිළිවෙළකට පිළියෙල කිරීම
- අදහස් නිවැරදි ව ප්‍රකාශ කිරීම

(66 පිටුවට)



**6 රූපය**

# 2000 දී සරසවි...

(20 පිටුවෙන්)

නිදසුන්

2. 41




8 රූපය

ඉහත සඳහන් ප්‍රස්ථාරයෙන් පෙන්නුම් කරන්නේ පහත දැක්වෙන අවස්ථා අතුරින් කුමන අවස්ථාව ද?

1. නිශ්චලතාවේ සිට ආරම්භ වන මෝටර් රථයක චලිතය
2. මහනුවරට ලැබෙන වාර්ෂික වර්ෂාපතනයේ මාසික වෙනස් වීම
3. මෝටර් රථයක ඉන්ධන ටැංකියක ඉන්ධන වැය වන වේගය
4. ජලාශයක උෂ්ණත්වය පෙ. ව. 6.00 සිට ප. ව. 6.00 දක්වා වෙනස් වන අයුරු
5. මීටර් 100 දිවීමේ තරගයක දී ක්‍රීඩකයකුගේ ශක්තිය වැය වන ශීඝ්‍රතාව

- ප්‍රශ්න අංක 2. 42 හා 2. 43 පහත දැක්වෙන රූපසටහන මත පදනම් වේ.




9 රූපය

එක් මිනිස් සිරුරක් තුළ ද්‍රව්‍ය පැතිර ඇති ආකාරය

2. 42 ඒ මිනිස් සිරුරේ බර 70 Kg නම් එහි අඩංගු ප්‍රෝටීන් ප්‍රමාණය පහත සඳහන් ඒවායින් කවර එක ද?

1. 10 Kg 2. 14 kg * 3. 16 kg 4. 18 kg 5. 20 kg

2. 43 මෙම වෘත්තාකාර රූප සටහනේ මේද ප්‍රමාණය දැක්වෙන ප්‍රදේශය කුමන අගයක කෝණයක් නිරූපණය කරයි ද?

1. 54° * 2. 56° 3. 58° 4. 60° 5. 72°

- ප්‍රශ්න අංක 2. 44 සහ 2. 45 පදනම් වන්නේ මතු දැක්වෙන ඡේදය මත ය.

ප්‍රජාතන්ත්‍රවාදී ආකල්ප සෑම පුරවැසියකු තුළ ම සමාන මට්ටමකින් සහ නිත්‍ය ස්වරූපයකින් නැත. ඒ. එන්. වයිට්හෙඩ් නමැති සුප්‍රකට ඉංග්‍රීසි ජාතික ගණිතඥයා සහ දර්ශනිකයා පිළිබඳ ව එය එසේ විය. බසයකින් ගමනක් යන විට ඔහු කිසියම් පෞරාණික ප්‍රාඥයකු තමා ළඟ වාඩිවී සිටින්නේ යැයි සිතින් මවා ගෙන ඒ තැනැත්තා සමඟ කථා බහ කිරීමට පුරුදු වී සිටියේ ය. එහෙත් එක් පෞරාණික ප්‍රාඥයකු සමග තමා එවැනි සංවාදයක නිරත වීම ගැන සිතා ගැනීමට වයිට්හෙඩ්ට කිසිසේත් නොහැකි විය. ඒ ප්‍රාඥයා 'ජනරජය' නම් ග්‍රන්ථය ලියූ ප්ලේටෝ නමැති පෞරාණික ග්‍රීක දර්ශනිකයා විය. ප්ලේටෝ ගැන වයිට්හෙඩ් තුළ තිබූ ගෞරවය කෙබඳු ද යත්, ප්ලේටෝ සමග බසයක දී කථා බහ කිරීම වයිට්හෙඩ්ට සිතා ගැනීමට බැරි කටයුත්තක් විය. එහෙත්, ප්‍රජාතන්ත්‍ර ආකල්පයට අනුව කිසි ම මිනිසකු මිනිස් ඇසුර අභිභවා යන තරමට ප්‍රාඥවන්ත හෝ සදචාරාත්මක හෝ නැත. සෑම මිනිසකු ම ප්‍රජාතන්ත්‍රික බසයේ ඉඳ හිට හෝ යෑමට සුදුස්සෙක් ම ය.

2. 44 යථෝක්ත ඡේදයෙන් පැවසෙන්නේ කුමක් ද?

1. වයිට්හෙඩ් ප්ලේටෝගේ 'ජනරජය' නමැති කෘතිය කියවීමට අතිශයින් ආශා කළ බවයි.
2. වයිට්හෙඩ් තමා සමඟ ම කථා බහ කිරීමට පුරුදු වී සිටි බවයි.
3. වයිට්හෙඩ් ග්‍රීක දර්ශනිකයකු වූ බවයි.
4. වයිට්හෙඩ් ප්ලේටෝ බසයක දී හමු වූ බවයි.
5. වයිට්හෙඩ් ප්ලේටෝට අතිශයින් ගරු කළ බවයි. *

2. 45 මේ ලේඛකයාට අනුව, සැබෑ ප්‍රජාතාන්ත්‍රික ආකල්පයකින් යුතු මිනිසකු කළ යුත්තේ කුමක් ද?

1. තමාට වඩා බුද්ධියෙන් අඩු අයට වඩා තමා උසස් බව සැලකීමයි.
2. තමාට වඩා පොහොසත් අයට වඩා තමා පහත් බව සැලකීමයි.
3. තමාට ගරුකර ගන්නා අතර, අන් සියල්ලන් තමාට ගරුත්වයෙන් සමාන බව සැලකීමයි. *
4. යම් කෙනකු ඇදහීමට අවශ්‍ය බව පිළිගැනීමයි
5. සියලු දෙනා ම බලය භුක්ති විඳීම අවශ්‍ය බව පිළිගැනීමයි.

* නිවැරදි පිළිතුර